# අද්‍යතන ශ්‍රී ලාංකේය රූපවාහිනියෙන් ප්‍රකාශිත දෘශ්‍ය දූෂණය පිළිබඳව කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
06 AUG 2013
UNIVERSITY OF KELANIYA

**ඩී.එම්. විජේසිංහ**

ලියාපදිංචි අංකයඃ FGS/03/02/06/2006/02

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයෙහි
ජනසන්නිවේදනය පිළිබඳ දර්ශනපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී.

ප්‍රවේශ අංකය: 832
වර්ග අංකය:

**දර්ශනපති (ජනසන්නිවේදන)**

2012 ජූලි

## **නිබන්ධන සාරාංශය** (Abstract)

අද්‍යතන තොරතුරු ශිෂ්ටාචාරය (Information Society) තුළ රූපවාහිනී මාධ්‍යය ගෝලීය කර්මාන්තයක් වශයෙන් ලබා ඇති සිරස් හා තිරස් වර්ධනයත් සමග එහි ආවේනික ශඛ්‍යතාවන් මගින් ප්‍රේක්ෂකයා කෙරෙහි සුවිසාල බලපෑමක් සිදුකරමින් තිබේ. මේරි බා සඳහන් කරන පරිදි (Marie Barr Ann, 1997) දේශපාලන, වාණිජ, වෙළඳ හෝ වෙනත් ප්‍රාග්ධන අවශ්‍යතාවන් අනුව රූපවාහිනිය මගින් ප්‍රතිනිර්මාණය කරනු ලබන අතථ්‍ය දෘශ්‍ය සංරචනය මගින් ප්‍රේක්ෂකයා තුළ ප්‍රබල සමාජ මනෝවිද්‍යාත්මක මෙහෙයවීමක් (Socio-Psychological Manipulation) සිදුකරයි. රූපවාහිනී මාධ්‍ය මඟින් අද්‍යතන සමාජ විඥානයේ සියලුම ක්ෂේත්‍ර වේගයෙන් මාධ්‍යකරණය කෙරේ. මේ මගින් දැඩි සංස්කෘතික හා සාමාජීය බලපෑම් ඇතිකරනු ලබයි. පශ්චාත් නූතන චින්තකයෙකු වන ෂොන් බව්ඩ්‍රිලාඩ්ගේ අදහස වන්නේ (Baudrillard, 1998) ඉහත පරිදි ධනේශ්වර ක්‍රමය මඟින් අතිවිශාල වශයෙන් නිෂ්පාදනය කොට අද්‍යතන මාධ්‍ය භාවිතයෙන් යථාර්ථයක් ලෙස හුවා දක්වනු ලබන දෘශ්‍ය රූපය හුදෙක්ම බොල්, ආභාසන රූපයක් (Simulacrum) වන බවයි. රූපවාහිනී ප්‍රේක්ෂකයා සහ පවුල සර්වව්‍යාපී වශයෙන් මෙම ආභාසන රූපය සමග සම්බන්ධතා පවත්වයි. ඒ තුළ කලාත්මක වැඩසටහන් සහ යථාර්ථය යන දෙකම සාර්වර්ත්‍රික ආභාසන රූපයක් (Universal Simulacrum) දක්වා විතැන්වී ඇත. නිරූපණය සහ යථාර්ථය (Representation and Reality) අතර වෙනස උච්ඡ වූ කල්හි ආභාසන රූපය බිහිවන බව ඔහුගේ මතයයි. එනම් දෘශ්‍ය සංඥාව හා එමඟින් සංකේතවත් කරන බාහිර ලෝකයේ යථාර්ථය අතර වෙනසයි. මෙය රූපවාහිනී මාධ්‍යයේ නෛසර්ගික ලක්ෂණයක් ද වන අතර ඒ තුළ දක්නට ඇති උග්‍ර පාරභෞතික ස්වරූපය ඒ මගින් නිර්මාණය වන ගැටළුවයි. මෙය එම මාධ්‍යයෙහි දූෂණය ලෙස හඳුනා ගැනේ. රූපවාහිනී නාලිකා මගින් විකාශය වන ප්‍රවෘත්ති වාර්තාකරණය, ටෙලිනාට්‍ය, වෙළඳ ප්‍රචාරණ දැන්වීම්, රියලිටි වැඩසටහන් මෙන්ම වෙනත් බොහෝ වැඩසටහන්වල ව්‍යාජ, අතථ්‍ය ආඛ්‍යානවල මෙහෙයවීම නිසා ප්‍රේක්ෂකයාගේ චර්යාව, සාමාජීය සම්බන්ධතා අයහපත් ආකාරයෙන් වෙනසකට ලක් කරන හා තෝරා ගැනීමට ඇති නිදහස සම්බන්ධව සහ හබමාස් දක්වන පරිදි (Habermass, 1962, translated by Burger, 1989) සෑම පුද්ගලයෙකුටම තම අදහස් සාකච්ඡා කළ හැකි පොදු අවකාශය භාවිතා කිරීම පිළිබඳ පුද්ගලයාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය උල්ලංඝනය කරන හා පොදු අවකාශය පෞද්ගලීකරණය කර ඇති රූපවාහිනී මාධ්‍යයෙහි අතථ්‍ය, දූෂිත දෘශ්‍ය භාවිතය පිළිබඳව මේ මගින් අධ්‍යයනය කරයි. අද්‍යතන සමාජ ආර්ථික ක්‍රමයේ විවිධ අවශ්‍යතා මත එවැනි දෘශ්‍ය ආඛ්‍යාන ගොඩනැංවීම තුළ එය අතථ්‍ය ප්‍රතිනිර්මාණයක් බවට පත්වී තිබීමත්, ඒ මගින් ප්‍රේක්ෂකයා සංකීර්ණ අයුරින් මතවාදී මෙහෙයවීමකට ලක්කිරීම හා සාමාජීය බලපෑමක් සිදුවීමත් නිසා එම ප්‍රතිනිර්මාණිත දෘශ්‍ය දූෂිත දෘශ්‍ය ප්‍රකාශනයක් බවට පත්වී ඇත. ඒ අනුව තොරතුරු ප්‍රචාරණය හැරුණවිට සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලාංකේය රූපවාහිනියෙහි වඩා වැඩි මෙහෙයවීමක් සහිත වැඩසටහන් ලෙස නිරීක්ෂණය වන ටෙලිනාට්‍ය හා ප්‍රචාරණ දැන්වීම් මගින් සාමාජීය වශයෙන් සිදුකරන බලපෑම පිළිබඳ විශ්ලේෂණයක් මෙම පර්යේෂණය මගින් සිදුකර ඇත.

**ඉඟි පද (Key Words)**: දෘශ්‍ය මාධ්‍ය දූෂණය (Visual Media Pollution), රූපවාහිනිය (Television), ආභාසන රූපය (Simulacrum), මෙහෙයවීම (Manupulation), හැසිරීම (Behaviour), ජනමතය (Public Openion), දෘශ්‍ය සංඥාර්ථ (Visual Semiotics), මාධ්‍ය සාක්ෂරතාව (Media Literacy), පොදු අවකාශය (Public Sphere).